# 10 ශ්‍රේණිය

# ඉතිහාසය

කියවීම් ද්‍රව්‍යය



## ඒකකය 3

# ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම 01





## පූර්ව රාජ්‍ය සමය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම

## පූර්ව රාජ්‍ය සමය

ශ්‍රී ලංකාව ජනාවාස වීම ප්‍රාග්ඓතිහාසික ගල් යුගයෙන් ආරම්භව පූර්ව ඓතිහාසික යුගය හරහා ඓතිහාසික යුගය දක්වා ක්‍රමිකව සිදු වූ අතර ඊට සමගාමීව ශ්‍රී ලංකාවේ දේශපාලන බලයද ක්‍රමිකව වර්ධනය වී ඇත. විජය කුමරු ඇතුළත් ආර්ය සංක්‍රමණ නිසා ශ්‍රී ලංකාව ජනාවාස වූ බව ප්‍රකාශ වූවද අප ඉහතින් ඉගෙන ගත් කරුණු අනුව එය එසේ නොවූ බව තහවුරුවේ.විජය කුමරු මෙහි පැමිණීමට පෙර මෙරට ජනාවාස පැවති බව පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් තහවුරු වී තිබේ. ක්‍රිස්තු පූර්ව 2400 තරම් ඈත කාලයක සිට මෙරට කෘෂිකාර්මික සමාජයක් දියුණු වෙමින් පැවති බව බෙරගල, හල්දුම්මුල්ල ආදි ප්‍රදේශවලින් සොයා ගෙන තිබෙන පැරණි සොහොන් බිම්වලින් තහවුරු වී ඇත.

මුල් කාලයේ දී යම් ප්‍රදේශයක සිටින පුද්ගලයින්ගේ කැමැත්ත මත එම ප්‍රදේශය පාලනය කිරීම සඳහා පාලකයින් පත් කරගෙන ඇත.එහිදී ඔහුගේ බලය ධනය හා හැකියාව වැනි සාදක කෙරෙහිද ජනයාගේ අවධානය යොමුවන්නට ඇත. වැඩි දෙනෙකුගේ එකඟතාවෙන් පාලකයකු රට පාලනය කිරීමේ අයිතිය ලබා ගන්නා නිසා එවැනි පාලකයකු හැඳින්වීමට ‘මහාසම්මත’ යන වචනය පැරණි කාලයේ පෙරදිග රටවල භාවිත කර තිබේ. එවැනි පාලකයින්ගේ පාලන ප්‍රදේශ විශාල ප්‍රදේශකරා ව්‍යාප්ත වීමත් සමඟ පාලන කටයුතු ක්‍රමිකව වර්ධනය වී ඇති අතර එහිදී පාලනව විධිමත් කරගැනීම සඳහා නිලධාරී පිරිසකගේ සහයෝගයද පාලකයා හට හිමිව ඇත.

ශ්‍රී ලංකාවේ මුල්කාලීන දේශපාලන බලය ගෘහපති, ගමික හා පරුමක වැනි පාලකයන් රාශියක අත පැවති අතර එවැනි නිලධාරීන් විශාල ප්‍රමාණයක් ලංකාවේ පාලන කටයුතු වලට සම්බන්ධ වී ඇත.ඒ අනුව පෙනී යන්නේ ලංකාවේ දේශපාලන බලය පාලකයින් රාශියක් අතරේ බෙදී පැවති බවයි. එය බලය බෙදීගිය නැතහොත් විමධ්‍යගත පාලනයක් ලෙස සැලකේ. ඉහත පාලකයින්ගේ දේශපාලන බලය ක්‍රමිකව වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යත්වය බිහිවිය. පාලකයින් රැසක් අත පැවති දේශපාලන බලය ක්‍රමයෙන් එක් පාලකයෙකු වටා ඒකරාශී වීම නිසා රාජ්‍යයත්වය බිහිවිය. එවැනි පාලනයක් මධ්‍යගත පාලනය ලෙස හැඳින්විය හැකිය.

## පූර්ව රාජ්‍ය සමයේ දී පාලන කටයුතු හා සම්බන්ධ වූ පාලකයන්

ගෘහපති

ගමික

පරුමක

# ගෘහපතිවරුන්

ශ්‍රී ලංකාව ජනාවාය වූ මුල් කාල වකවානුවේ දී ගෝත්‍රික පාලන ක්‍රමයක් පැවති අතර ස්ථිර ජනාවාස ආරම්භ වී පවුල් (කුලය) වශයෙන් ජනයා ඒකරාශීවීමත් සමඟ එම පවුල තුළ සිටි සාමාජිකයින් මැනවින් කළමණාකරණය කිරීම සඳහා යම් පාලන ක්‍රමවේදයක් විශ්‍ය විය. එහි දී පවුල තුළ සිටි ධනයෙන්, බලයෙන් හෝ වයසින් මුහුකුරා ගිය පුද්ගලයා පවුලේ නායකයා බවට පත්වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. එවැනි පුද්ගලයින් ගෘහපති ලෙස හඳුන්වා ඇති අතරි ඔවුන් සෙල්ලිපි වල හඳුන්වා ඇත්තේ ගහපති නමිනි. ගෘහපති වරුන් පිළිබඳ තොරතුරු සඳහන් සෙල්ලිපි රැසක් ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමු වී ඇත.

<u>අනුරාධපුරයේ පෙරියපුලියන්කුලම ලිපිය</u>

සුමනගේ පවුලට අයත්, ලෝහ වැඩ සිය රැකියාව ලෙස කළ ගෘහපතියකු භික්ෂූන් වහන්සේලාගේ සැපපහසුව වෙනුවෙන් ගල්ගුහාවක් පිරිසිදු කොට පූජා කළ බව සඳහන් වේ.

පවුලේ රැකවරණය, ආර්ථික දියුණුව ගැටලු විසඳීම හා ගමේ පොදු කටයුතු සඳහා පවුල වෙනුවෙන් නියෝජනය කිරීම ආදී වගකීම් ගෘහපතිවරයා හට පැවරීඇත.

# ගමිකවරුන්

පවුල් 1 සිට 30 ක් අතර ප්‍රමාණයක් එකට එක්වී ගම් නිර්මාණය වූ අතර ගමේ නායකයා ගමික හෝ ග්‍රාමික නමින් හැඳින් වේ. අතීත ජනයා තමන්ගේ ගමේ පිහිටීමට සාපේක්ෂව අනෙකුත් ගම්මාන හඳුනාගෙන ඇත.

අපේ ගම (තමන් විසූ ගම)

අල්ලපු ගම (යාබද වපිහිටි ගම)

පිටගම් (ඈතින් පිහිටි ගම්)

ගමේ සිටි පවුල් ප්‍රධානීන් හෙවත් ගෘහපතිවරුන්ගේ එකගතාවයෙන් ගමේ ගෘහපතිවරු අතර සිටි ධනයෙන් , බලයෙන් හැකියාවන්නේ සපිරි පුද්ගලයා ගමේ නායකත්වයට පත්වන්නට ඇත. ගමේ නායකයා තෝරා ගැනීමේ දී ඔහු සතු ධනවත් භාවය ප්‍රධාන සාධකයක් වන්නට ඇත. පැරණි ගමක ජීවත් වූ දිළිඳු වැසියෙකු ඊළඟ කන්නයේ ලබා දෙන පොරොන්දුව පිට ඒ ගමේ විසූ ගමිකයාගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගත් පුවතක් ජාතකට්ඨකථාවේ දැක්වේ. ගමිකයින් යනු අන් අයට පවා උදවු කළ හැකි තරමට ධනවත් වූ පිරිසක් බව ඉන් වටහා ගත හැකි ය.ගමික වරයා ගෘහපතින් අතරෙන්ම තේරී පත් වූ බව බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත සමන්තපාසාදිකාවේ සඳහන්ව ඇත. ගමික වරු න් පිළිබඳව තොරතුරු සඳහන් සෙල්ලිපි රැසක් ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් හමු වී ඇත.

<u>හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් සිතුල්පව්ව කොරවක්ගල ප්‍රදේශයේ සෙල්ලිපිය</u>

ගමික සිව, ගමික සුමන සහ ගමික තිදන නම් ගම් නායකයින් තිදෙනා ගල්ගුහාවක් පිරිසිදු කර භික්ෂූන්වහන්සේලාට පූජා කළ බව සඳහන්ය.එමගින් අතීත ගම් නායකයින් සුහදව කටයුතු කළ බව තහවුරු වේ.

## ගමිකගේ වගකීම්

ගම්වල පොදු කටයුතුවලට නායකත්වය දීම

ගමට අයත් වැව නඩත්තු කිරීම

වැවේ ජලය බෙදා හැරීම

ගම්වල පැවති ආරවුල් විසඳීම

ගම නියෝජනය කරමින් සහභාගී වීම

ආවාහ-විවාහ කටයුතු වලදී

භාණ්ඩ හුවමාරු කර ගැනීමේදී

විවිධ ආරවුල් විසඳීම සඳහා

# පරුමකවරුන්

පැරණි සමාජයේ ප්‍රධානතම ජීවනෝපාය මාර්ගය වූයේ කෘෂිකර්මාන්තයයි මුල්ම කාලයේ දී වර්ෂා ජලයෙන් ගොවිතැන් කටයුතු කළ අතර ජනාවාස වල ජනගහණය වර්ධනය වීමත් සමඟම වැඩිවන ජනගහණයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය ද වේගවත් කළ යුතු විය. එහිදී ඔවුන්ට මුහුණ දීමට සිදු වූ ප්‍රධානතම අභියෝගය වූයේ වර්ෂා ජලය ප්‍රමාණවත් නොවීමයි. එහිදී ඔවුන් එම අභියෝගය ජයගැනීමට සිදුකරනු ලැබුවේ වර්ෂා ජලය ගබඩාකර තබා ගැනීමේ අරමුණින් කුඩා වැව් ඉදිකිරීමයි ඒවා ගම් වැව් ලෙස හැඳින්වේ. ක්‍රමයෙන් තවදුරටත් ජනගහණය වර්ධනය විමත් සමග ජල හිගය තව දුරටත් ආහාර නිශ්පාදනය වේගවත් කිරීමට ගැටළුවක් විය. එම අභියෝගය ජයගැනීම සඳහා එකිනෙකට ආසන්නයේ පිහිටි ගම් වැව් කිහිපයක් ඇල මාර්ග මගින් එකිනෙකට සම්බන්ධකර වැව් පද්ධති ඉදිකරන ලදි. අතීතයේ දී මෙම වැව් පද්ධති එල්ලංගාව හෙවත් වාරි ප්‍රපතනය ලෙස හඳුන්වා ඇත. මෙම වැව් පද්ධති ඉදිකිරීම සරළ ක්‍රියාවක් නොවූ අතර ඒසඳහා ගම්මාන වල නායකයින්ගේ අනුමැතිය කැමැත්ත ලබා ගත යුතු විය. වැව් පද්ධතිය මනාලෙස නඩත්තු කිරීමද පරිපාලනය කරිමද සිදුකළ යුතු කාර්යක් විය. එහි දී වැව් පද්ධතිය ඉදිකිරීමට දායක වූ ගම් නායකයින් අතරින් අයෙක් ගම් වැව් පද්ධතියේ පාලකයා බවට පත්විය. ඔහු පරුමක , ප්‍රමුඛ ආදී නාමයන්ගෙන් හඳුන්වා ඇත. වැව් කිහිපයක් ඇළ මාර්ගවලින් සම්බන්ධ කොට වැව් පද්ධති ඉදිකිරීමේ අරමුණු දෙකක් තිබිණි. පළමු වැන්න භූමියක ඉහළින් පිහිටි වැවක් වැසි දියෙන් පිරුණු විට ඉන් බැහැරට ගලා යන ජලය පහළින් ඇති වැවට හරවා ජලය සංරක්ෂණය කර ගැනීම යි. දෙවැන්න වැව් දෙකක් අතර ඇළ මාර්ගයේ නිරන්තරයෙන් ජලය ගලා යාමට සලස්වා ඇළ දෙපස භූමියේ තෙතමනය ඉහළ දැමීම යි.

සෑම වැව් පද්ධතියකට ම අයත් පරුමකයෙක් සිටි බව පැහැදිළිය. මෙලෙස බිහි වූ පරුමකවරුන් සියගණනක් පිළිබඳ තොරතුරු පැරණි සෙල්ලිපිවල දක්නට තිබේ. පිරිමින් පමණක් නොව ඇතැම් අවස්ථාවල කාන්තාවන් ද ප්‍රාදේශීය පාලනයට හවුල් වී තිබේ. එවැනි කාන්තාවන් හඳුන්වන ලද්දේ පරුමකලු නමිනි.

## දඹුල්ලට නුදුරු කණ්ඩලම , කොත්ගල්කන්ද ලිපිය

ගල්ගුහාවක් භික්ෂූන් වහන්සේලා වෙත පූජා කළ පරුමකයෙකු පිළිබඳ තොරතුරු දක්වා ඇත. එහි ඔහු හඳුන්වා තිබෙන්නේ "තොට බොජක" යන නමිනි. එහි තේරුම "තීර්ථය අනුභව කරන්නා" යන්න යි. තීර්ථය යනුවෙන් හැඳින්වෙන්නේ තොටුපළ යි. අනුභව කිරීම යනුවෙන් පැරණි කාලයේ ව්‍යවහාර කරන ලද්දේ අය බදු ලබා ගැනීමත් දේපළ භුක්ති විඳීමත් ය.

## කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් මැදගම පිහිටි පුරාණ විහාරයේ ලිපිය

මෙම සෙල්ලිපියේ තිස්ස නමින් හැඳින්වූ නැට්ටුවෙකු ගැන සඳහන් වේ. මෙම නැට්ටුවාගේ බිරිය පරුමකවරියක ලෙස හඳුන්වා දී ඇත.

## අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් බ්‍රාහ්මණයාගම සෙල් ලිපිය

මෙහි පරුමකලු සමනා නම් කාන්තාවක් ගැන සඳහන් ය. ඇය පරුමක නදික නමැත්තාගේ බිරිඳ ලෙස එහි සඳහන් ය.

## පරුමක වරයාගේ කාර්යය භාරය

ගම් වැව් පද්ධතියේ පාලනය

නඩත්තු කටයුතු

වැව් පද්ධතියේ ජනතා ගැටලු විසඳීම

පසු කාලීනව ඇතැම් ගම් වැව් පද්ධතිවල පාලකයින් හෙවත් පරුමක වරුන් තම හැකියාවන් වර්ධනය කරගනිමින් අවට වැව් පද්ධති හෝ ගම්මාන යටපත් කරගනිමින් විශාල ප්‍රදේශයක බලය ව්‍යාප්ත කළ අතර ඔවුන් බලවත් පාලකයින් බවට පත් විය. ඔවුන් මහා පරුමක, මපුරුමුකා හෙවත් රජ යන නාමයෙන් හඳුන්වා ඇත.